FACULTY OF MEDICINE
DEANS OFFICE
19 JAN 2023
UNIVERSITY OF KELANIYA

# සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය ෨෦෨෩

## ඔබත් අංකුර පරිවර්තකයෙක්ද? මෙන්න ඔබටත් අවස්ථාවක්

අවුරුදු 16 ට වැඩි ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි සිංහල - ඉංග්‍රීසි බසින් සාහිත්‍ය කෘති
පරිවර්තනයේ යෙදෙන ඔබට
පහත තරග ශීර්ෂ යටතේ තරගවැදීමට අවස්ථාව

- සිංහල - ඉංග්‍රීසි කෙටිකතා පරිවර්තන තරගය
- සිංහල - ඉංග්‍රීසි කාව්‍ය පරිවර්තන තරගය
- ඉංග්‍රීසි - සිංහල කෙටිකතා පරිවර්තන තරගය
- ඉංග්‍රීසි - සිංහල කාව්‍ය පරිවර්තන තරගය

තෝරා ගත් තරග ජයග්‍රාහකයින් සදහා වටිනා සහතිකයක් හා ත්‍යාග පිරිනැමෙන අතර තරගාවලිය අවසානයේදී
එක් දින සාහිත්‍ය නිර්මාණ පරිවර්තන පුහුණු වැඩමුළුවකට
යොමු කරනු ඇත

ඔබගේ වටිනා පරිවර්තනය චක්‍රලේඛයේ පරිදි ආදර්ශ අයදුම්පත්‍රයක් සකස් කර
එහි සදහන් පොදු කොන්දේසි වලට යටත්ව තැපැල් මගින් හෝ ගෙනැවිත්,

ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ

යන ලිපිනයට 2023 අප්‍රේල් මස 01 වන දිනට පෙර හෝ එදිනම අප වෙත භාර දෙන්න
ඔබගේ නිර්මාණයට නිසි ඇගයුම අප ලබා දෙන්නෙමු

චක්‍රලේඛය හා ආදර්ශ අයදුම්පත බාගත කර ගැනීම සදහා
www.minuwangoda.ds.gov.lk
(Divisional secretariat - Minuwangoda)

සංවිධානය
සංස්කෘතික අංශය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ

වැඩිදුර විමසීම්
0770299330 - සංජය
0711528535- සංජීවනි

# ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මීනුවන්ගොඩ

# Divisional Secretariat - Minuwangoda

මගේ අංකය - මීනු/06/13/02 දිනය - 2023.01.03

## <u>සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය- 2023</u>

ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි අංකුර සාහිත්‍ය නිර්මාණ පරිවර්තකයින්ගේ දක්ෂතා ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන තරගාවලියකි. මෙම තරගාවලිය සඳහා අංශ හතරක් යටතේ තරගකරුවන්ට ඉදිරිපත් විය හැකි අතර පහත සඳහන් විශේෂ කරුණු යටතේ ඇගයීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**පොදු කොන්දේසි -**

- සිංහල හා ඉංග්‍රීසි යන භාෂා දෙකෙන් පමණක් මෙම පරිවර්තන නිර්මාණ තරගාවලිය ක්‍රියාත්මක වේ..
- තමා කැමති සිංහල හෝ ඉංග්‍රීසි බසින් ලියවුනු කෙටිකතාවක් හෝ කවියක් පරිවර්තනය කර මෙහි සඳහන් ලිපිනයට තැපැල් මගින් හෝ ගෙනැවිත් බාර දීම සිදු කල හැක.
- මුල් පිටපත අදාල පරිවර්තනය සමග යොමු කල යුතුවේ.ඔබ විසින් පරිවර්තනය කල මුල් පිටපත මුද්‍රණය කල ග්‍රන්ථයකින් ලබා ගත් නිර්මාණයක් විය යුතුවේ.එය මෙතෙක් ඔබ විසින් හෝ වෙනත් පරිවර්තකයෙකු අතින් පරිවර්තනය නොවූ නිර්මාණයක් වීම අනිවාර්ය වේ. සමාජ ජාලා වෙබ් අඩවි වල පල වූ නිර්මාණ මේ සඳහා බාර ගනු නොලැබේ.
- ඔබගේ නිර්මාණය වෙනත් පරිවර්තකයෙකු විසින් සිදු කල පරිවර්තනයක් හෝ එම පරිවර්තනයේ කොටස් ඔබගේ නිර්මාණය තුල තිබෙන බව හෙළි දරව් වුවහොත් එම නිර්මාණය තරගයෙන් ඉවත් කරනු ලැබේ.
- සෑම නිර්මාණයක් ම A4 කඩදාසියේ තනි පැත්තේ යතුරු ලියනය කර හෝ පැහැදිලි අත් අකුරින් ලියා එවීම සිදු කල යුතුවේ.
- මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය පුරවා අදාල නිර්මාණය එහි මුල් පිටපත සමග අප වෙත එවිය යුතු වේ.
- තරගාවලියෙන් තෝරා ගන්නා පරිවර්තකයින් සඳහා ප්‍රවීණ සම්පත්දායකයින් යොදා ගනිමින් **විශේෂ එක් දින පුහුණු වැඩමුළුවක්** පවත්වනු ලබන අතර ඒ සඳහා මෙම තරගාවලියෙන් පසුව දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.
- වයස අවුරුදු 16 ට වැඩි ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් සඳහා මෙම තරගය විවෘත වේ.
- එක් තරගකරුවෙකුට ඕනෑම තරග ශීර්ෂයකට ඉදිරිපත් විය හැකිය.
- ජයග්‍රාහී නිර්මාණ සඳහා ත්‍යාග හා සහතිකපත් හිමි වන අතර මෙයින් තෝරා ගත් තරගකරුවන් උක්ත එක් **දින පුහුණු වැඩමුළුවට සහභාගී වීම අනිවාර්ය වේ.**
- විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.
- ඔබගේ පරිවර්තනය ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,මීනුවන්ගොඩ (දු.ක 077-0299330) යන ලිපිනයට 2023 අප්‍රේල් මස 01 වන දිනට පෙර තැපැල් මගින් හෝ ගෙනැවිත් බාර දිය යුතුවේ

# ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මිනුවන්ගොඩ
# DIVISIONAL SECRETARIAT – MINUWANGODA
# பிரதேச செயலகம் - மினுவங்கொட


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය: My No:எமது இல: | මිනු/06//08/02 | ඔබේ අංකය:Your No: உமது இல: | | දිනය :Date: திகதி: | 2023.01. 25 |

විදුහල්පති
[illegible]
..........................................

## සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය - 2023

ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි අංකුර සාහිත්‍ය නිර්මාණ පරිවර්තකයින්ගේ දක්ෂතා ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන උක්ත තරගාවලිය සඳහා නිර්මාණ කැඳවීම මේ වන විට ආරම්භ කර ඇත.

ඒ සඳහා උනන්දුවක් දක්වන තරගකරුවන් ඇත්නම් මේ සමග අමුණා ඇති චක්‍රලේඛයට අනුව නිර්මාණ සකස් කර ආදර්ශ අයදුම්පත්‍රය ද සමග අප වෙත ලැබීම සඳහා ඔබ ආයතනයට හෝ ප්‍රදේශයට සම්බන්ධ පිරිස් දැනුවත් කිරීම සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

තවද මේ සඳහා ඔබ දක්වන සහයෝගය නිර්මාණශිලී සමාජයක් වෙනුවෙන් ඔබ සිදු කරන කැපවීමක් ලෙස ඉතා අගය කොට සලකමි.

ප්‍රාදේශීය ලේකම්
මිනුවන්ගොඩ

යූ.ඩබ්ලිව්.ටී.යූ. රාජකරුණා
ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ.


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් Divisional Secretary பிரதேசசெயலாளர் | 0112295135 | ගණකාධිකාරී Accountant கணக்காரன் | 0112295238 | පරිපාලන නිලධාරී Administrative Officer நிர்வாக உத்தியோகத்தர் | 0112296715 |
| සහකාර ප්‍රාදේශීය ලේකම් Asst. Div. Secretary உதவி பிரதேசசெயலாளர் | 0115660192 | ස.අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන) Asst. Director(Planning) உதவி திட்டமிடல் பணிப்பாளர் | 0112295980 | පොදු General பொது | 0112299490 |

ෆැක්ස්/Fax/தொலைநகல்-0112295135විද්‍යුත් තැපෑල/E.mail/மின்னஞ்சல்:ao@minuwangoda.gov.lkවෙබ්/Web/வெப் : www.minuwangoda.ds.gov.lk

යෝජිත තරග ඉසව්

01. සිංහල - ඉංග්‍රීසි කෙටිකතා පරිවර්තන තරගය

සිංහල බසින් ලියවුනු තමා අභිමත කෙටිකතාවක් ඉංග්‍රීසියට පරිවර්තනය කල යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 15 කි.

02. සිංහල - ඉංග්‍රීසි කාව්‍ය පරිවර්තන කරගය

සිංහල බසින් ලියවුනු තමා අභිමත කවියක් ඉංග්‍රීසියට පරිවර්තනය කල යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 03කි.

03. ඉංග්‍රීසි - සිංහල කෙටිකතා පරිවර්තන තරගය

ඉංග්‍රීසි බසින් ලියවුනු තමා අභිමත කෙටිකතාවක් සිංහලට පරිවර්තනය කර එවිය යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 15 කි.

04. ඉංග්‍රීසි - සිංහල කාව්‍ය පරිවර්තන තරගය

ඉංග්‍රීසි බසින් ලියවුනු තමා අභිමත කාව්‍ය නිර්මාණයක් සිංහලට පරිවර්තනය කර එවිය යුතුවේ. මුල් පිටපතේ උපරිම පිටු ගණන මුද්‍රිත පිටු 03 කි.

---

ආදර්ශ අයදුම්පත්‍රය

සාහිත්‍ය නිර්මාණ පරිවර්තන තරගාවලිය - 2023

01.සම්පූර්ණ නම - ..............................................................................................

02.ලිපිනය - ..............................................................................................

03.උපන්දිනය - ........................... වයස - .............................

04.දුරකතන අංකය - ........................... ප්‍රා.ලේ කොට්ඨාසය - ..........................

05.මුල් නිර්මාණයේ භාෂා මාධ්‍ය - සිංහල / ඉංග්‍රීසි (අනවශ්‍ය වචන කපා හරින්න)

06.තරග ඉසව්ව - ..............................................................................

07.නිර්මාණයේ නම - .......................................................................... (මුල් නිර්මාණයේ නම හා එය ලබා ගත් කෘතිය ද සඳහන් කරන්න)

08. පරිවර්තකගේ ප්‍රකාශය -

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරදි වන අතර මේ සමග අමුණා ඇති පරිවර්තනය මා විසින් සිදු කල බවත් එය වෙනත් අයුරකින් මා විසින් පල කල නොමැති බවත් මෙහි මුල් පිටපත දන්නා තරමින් මීට පෙර පරිවර්තනයකට ලක් කර නොමැති බවත් මෙම තරගය සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසි පිළිගැනීමට එකග වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය - .................. ..............................

අයදුම්කරුගේ අත්සන

ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මීනුවන්ගොඩ

යූ.ඩබ්ලිව්.ටී.ශූ. රාජකරුණා
ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
මිනුවන්ගොඩ.